www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව සුනාමි ආධාර පිලිබඳව අර්බුදයක

## Sri Lankan government in crisis over tsunami aid

**කේ. රත්නායක විසිනි**
**2005 ජුනි 11**

ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, මාස ගනනාවක් තිස්සේ කකුල් ගැටීමෙන් පසුව, දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වල පශ්චාත් සුනාමි නැවත ගොඩනැගීමේ වැඩ කටයුතු සඳහා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ඒකාබද්ධ මන්ඩලයක් පිහිටුවීමේ වැඩ කටයුතු අවසානයක් කරා ගෙන ඒමට ක්‍රියා කරමින් සිටී. සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් හා බෞද්ධ භික්ෂූන් වෙතින් දරුනු විරුද්ධත්වයක් අවුලුවා ඇති මෙම යෝජනාව, පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) භේද කොට ආන්ඩුව බිඳ වැටීමේ තර්ජනය මතු කරයි.

කුමාරතුංග එවන් එකගතාවකට අත්සන් කල හොත් තමන් ආන්ඩුවෙන් ඉවත් වන බවට එජනිසයේ දෙවන විශාලතම හවුල්කරු වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) දැනුම් දී ඇත. ජාතික මැතිවරනයෙන් යන්තම් මාස 15කට පසුව රට දේශපාලන අර්බුදයකට ඇද දමමින් එජනිස පාර්ලිමේන්තු බහුතරයකින් තොර තත්වයකට වැටෙනු ඇත. අනෙක් අතට, ජනාධිපතිනිය ඒකාබද්ධ ආධාර මන්ඩලයකට එකගවීමට අපොහොසත් වුව හොත්, එල්ටීටීඊය සමග හිර වී ඇති සාම සාකච්ඡා යලි ඇරඹීම ගැන බලාපොරොත්තු තැබිය නො හැකි වනු ඇති අතර දැනටමත් ආතති සහගතව පවත්නා සටන් විරාමය මුලුමනින් ම බිඳ වැටිය හැකි ය.

ඒකාබද්ධ යාන්ත්‍රනය ලෙස පොදුවේ හැඳින්වෙන, පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය පිහිටුවීමට කුමාරතුංග ඉක්මන් වී ඇත්තේ, මැයි මස මැද පැවති ශ්‍රී ලංකා ආධාර සමුලුව පොරොන්දු වූ එ.ජ. ඩොලර් බිලියන 3ක ආධාර මුදල්වලින් බොහොමයක් ලැබීම සාම සාකච්ඡා යලි ඇරඹීම මත රඳා පවතින බව ඇඟවීමෙන් පසුව ය. ඇගේ ආන්ඩුව බරපතල මූල්‍ය අපහසුතාවකට මුහුන දී සිටිනවා පමනක් නොව, කොලඹ ව්‍යාපාරිකයන් අතර සැලකිය යුතු කොටස් තර්ක කරන්නේ, ආර්ථිකයට ආධාර මෙන් ම රටේ ව්‍යසනකාරී 20 අවුරුදු සිවිල් යුද්ධයට නිත්‍ය විසඳුමක් ද අවශ්‍ය බවට යි.

පසුගිය සතියේ දී, කුමාරතුංග ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිලිබඳ සැලසුම් පැහැදිලි කරනු පිනිස අගමැති මන්මෝහන් සිං ඇතුලු ඉන්දියානු නායකයන් හමුවීම සඳහා නව දිල්ලියේ දින තුනක සංචාරයක යෙදුනා ය. එල්ටීටීඊයට විරුද්ධව වඩා ක්‍රියාකාරී ආස්ථානයක් ගන්නා ලෙස ඉන්දියාවෙන් ඉල්ලා සිටින ඇගේ දේශපාලන විරුද්ධවාදීන් නිරායුධ කිරීමට ඉන්දියාවේ ආශිර්වාද උදව්කාරක වනු ඇතැයි ඇය ගනන් බැලුවා ය. ඇයට නව දිල්ලියෙන් ලැබුනේ කොන්දේසි සහිත සහයෝගයක් පමනි.

ජුනි 7 දා මහනුවර දී පැවති රනවිරු දින රැස්වීමක කතා කරමින්, ජනාධිපතිනිය තමන් සුනාමි සහන මන්ඩලය පිලිබඳ වැඩ කටයුතු නිම කිරීමට ආසන්න බවට මෙතෙක් කර ඇති පැහැදිලිම ඇඟවුම කලා ය. "යුද්ධය දිගටම ඉදිරියට ගෙන යාම රටට දැරිය නො හැකි ය. (එල්ටීටීඊය සමග) සාකච්ඡා මගින් සාමය උදා කර ගැනීමට උත්සාහ කල යුතු ය" යැයි ඇය රැස්වීම අමතමින් පැවසුවා ය. ඇගේ ඉල්ලීම පරිදි, නෝර්වේජියානු තානාපති හැන්ස් බ්‍රැට්ස්කර් ඒකාබද්ධ යාන්ත්‍රනය පිලිබඳ එකගතාවක් ඇති කර ගැනීමේ වැඩ කටයුතු නිම කර ගනු පිනිස එල්ටීටීඊ දේශපාලන අංශ නායක එස්.පී. තමිල්චෙල්වම් හමුවනු සඳහා එදිනම කිලිනොච්චිය බලා ගමන් කලේ ය.

පසු දින ජවිපෙ කුමාරතුංග හෙලා දැක්කේ ය. සුනාමි සහන මන්ඩලය එල්ටීටීඊයට වෙනම දෙමල රාජ්‍යයක් තහවුරු කර ගැනීමට උදව් කරනු ඇති බවත් ජවිපෙ "අපගේ මව්බිම රැක ගැනීමේ උතුම් අරමුනෙන් යුතුව මෙම පාවාදීම පරාජය කිරීමට" ක්‍රියා කරනු ඇති බවත්, ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක විමල් වීරවංශ ප්‍රකාශ කලේ ය. සිය සහාග හවුල්කරුවන්ට නොදන්වා තීන්දු ගන්නා බවට ඔහු කුමාරතුංගට චෝදනා කලේ ය.

පලාත් සභා හතක එජනිස ආන්ඩුවට දෙන සිය සහයෝගය තමන් ඉවත් කර ගන්නා බව පසුගිය සති අන්තයේ දී ජවිපෙ නිවේදනය කලේ ය. අන්තගාමී හෙළ උරුමය පක්ෂයේ බෞද්ධ භික්ෂූන්ගේ පෙරමුනු සංවිධානය වන ජාතික භික්ෂු පෙරමුන කොලඹ කොටුව දුම්රිය පල අසල මාරාන්තික විරෝධතා උපවාසයක් දියත් කලේ ය.

ජවිපෙ උද්ඝෝෂනය මතකයට නංවන්නේ ඉන්දු-ලංකා ගිවිසුමට එය දැක්වූ ෆැසිස්ට්වාදී විරුද්ධත්වයි. එම ගිවිසුම එල්ටීටීඊය සමග ඇති කර ගැනුනු සාම ගිවිසුමක් අධීක්ෂනය කරනු පිනිස ඉන්දියානු මිලිටරියට මාවත සැකසී ය. එකල ජවිපෙ රට පාවාදීමක් ලෙසත් "ඉන්දියානු අධිරාජ්‍යවාදයේ" සැලසුම්වල කොටසක් ලෙසත් ගිවිසුම හෙළා දැක "ජාතිය ආරක්ෂා කර ගැනීමේ" "දේශප්‍රේමී" උද්ඝෝෂනයක් දියත් කලේ ය. ජවිපෙ තුවක්කුකාර කල්ලි, ඔවුන්ගේ වර්ජනවලට හා විරෝධතාවන්ට සහයෝගය දීම ප්‍රතික්ෂේප කල දේශපාලන විරුද්ධවාදීන් හා කම්කරුවන් බුරුතු පිටින් ඝාතනය කලහ.

දැන් ප්‍රථම වතාවට ආන්ඩු බලයේ සිටින ජවිපෙ, ඔවුන්ගේ කඩවුනු මැතිවරන පොරොන්දු හේතු කොට ගෙන, ගම්බද ප්‍රදේශවල ස්වකීය සමාජ පදනම් අතරින් ඇතුලු, මහජනයා වෙතින් වැඩෙන විරුද්ධත්වයන්ට මුහුන දී සිටී. ගම්බද හා නාගරික දුගීන් මත ඉවසිය නො හැකි බර පටවමින්, ජීවන වියදම නගී. ආන්ඩුව රාජ්‍ය-සතු තෙල් හා විදුලි බල ආයතන සංගතකරනය කිරීමේ සැලසුම් සහ සෙසු ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ඉදිරියට ගෙන යමින් සිටී. දෙසැම්බර් 26 සුනාමියෙන් පසුව හය මසකට ආසන්න කලක් ගෙවී ඇතත් නැවත ගොඩ නැගීමේ වැඩ කටයුතු තවමත් ඇරඹී නැති තරම් ය.

ජවිපෙ ස්වෝත්තමවාදී උද්ඝෝෂනයේ එල්ලය, විරෝධතා මාලාවක් ම අවුලුවා ඇති මෙම සමාජ ප්‍රශ්න වෙතින් මහජන අවධානය අපසරනය කරනු පිනිස වර්ගෝත්තමවාදී ආතතීන් ඇවිස්සීමයි. පසුගිය සිකුරාදා, දහස් ගනන් බස් කම්කරුවෝ, වැටුප් වැඩි කිරීමට ආන්ඩුව දුන් පොරොන්දු කඩකිරීම හේතු කොට ගෙන වැඩ වර්ජනයක නිරත වූහ. සිය වැටුප් වැඩි නො කල හොත්, ජූනි 16 දා වන විට වර්ජනයක් අරඹන බවට විශ්වවිද්‍යාල අනධ්‍යන කාර්ය මන්ඩලය තර්ජනය කරයි. වෙරලබඩ ප්‍රදේශවල යලි ඉදිකිරීම් තහනම් කිරීමේ ආන්ඩුවේ තීන්දුවට එරෙහිව සඳුදා නැගෙනහිර පලාතේ පොතුවිල්හි 10,000ක පමන ජනකායක් විරෝධතාවක නිරත විය.

පසුගිය වසරේ අප්‍රේල් මහ මැතිවරනයට පෙර පිහිටුවන ලද බෞද්ධ භික්ෂූන්ගේ ආධිපත්‍යයෙන් යුත් දක්ෂිනාංශික සිංහල අධිපතිවාදී පක්ෂයක් වන ජාතික හෙල උරුමයෙන් එල්ල වන දේශපාලන තරඟයකට ජවිපෙ මුහුන දී සිටී. බෞද්ධ භික්ෂුවක් වන, හෙල උරුමයේ ලේකම් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ඕමල්පේ සෝභිත, ඒකාබද්ධ යාන්ත්‍රනයට විරුද්ධ වීම ඇතුලු වර්ගවාදී ඉල්ලීම් මාලාවක් මත මහනුවර දී ස්වකීය මාරාන්තික උපවාසයක් පවත්වා ගෙන යයි. කුමාරතුංග සිය සැලසුම් හකුලා ගන්නා තෙක් සිය මන්ත්‍රීන් පාර්ලිමේන්තුව වර්ජනය කරන බව හෙල උරුමය සඳුදා නිවේදනය කලේ ය.

## දේශපාලන ආතතීන්

ජවිපෙ-හෙල උරුමය උද්ඝෝෂනය, සිංහල ස්වෝත්තමවාදයේ ගැඹුරින් ම ගිලී පවත්නා කුමාරතුංගගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) තුල තියුනු ආතතීන් නිර්මානය කර තිබේ. ජනාධිපතිනිය, ජවිපෙ හා ශ්‍රීලනිප මන්ත්‍රීන් වෙතින් එල්ල වන විරුද්ධත්වය කල් තියා වලකාගනු පිනිස, සඳුදාට නියමිතව තිබූ ආන්ඩුවේ මන්ත්‍රී කන්ඩායමේ රැස්වීමක් අවලංගු කලා ය. ඇය ඒ වෙනුවට, අගමැති මහින්ද රාජපක්ෂ, මුදල් ඇමති සරත් අමුනුගම සහ සංචාරක ඇමති අනුර බන්ඩාරනායක ඇතුලු ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් සමග සාකච්ඡාවක් පැවැත්වූවා ය.

එම රැස්වීමෙන් අනතුරුව, රාජපක්ෂ මාධ්‍යවලට කියා සිටියේ "නම්‍යශීලී" වන ලෙස තමා කුමාරතුංගගෙන් ඉල්ලා සිටි බවයි. "එජනිසයේ අනාගතය තර්ජනයට ලක් වන තතු යටතේ ඉක්මන් තීරනයක් ගැනීම නිෂ්ඵල වනු" ඇතැයි ඔහු පැවසී ය. හෙල උරුමය අස්වැසීමේ ප්‍රයත්නයක් ලෙස අගමැති මහනුවර උපවාසයේ යෙදී සිටින පක්ෂ නායක ඕමල්පේ සෝභිත බැහැදැකීමට ද ගියේ ය.

කලින් ජනාධිපතිනියගේ සමීප විශ්වාසවන්තයකු වූ වරාය සහ ගුවන් සේවා අමාත්‍ය මංගල සමරවීර ද ඊට සමාන ආස්ථානයක් ගත්තේ ය. පසුගිය සති අන්තයේ *ඉරිදා ලංකාදීප* පත්‍රයට දුන් සම්මුඛ සාකච්ඡාවක ඔහු මෙසේ පැවසී ය: "ඒකාබද්ධ යාන්ත්‍රනය සභාගය දුර්වල කිරීමට හෝ එය විනාශ කිරීමට හේතු වන්නේ නම් එවිට එය නිෂ්ප්‍රයෝජන වනු ඇත. ඒ ගැන යලි සිතා බැලීම අත්‍යවශ්‍ය ය. ඒකාබද්ධ යාන්ත්‍රනයෙන් පාලමක් තැනෙනවා වුවත් එය ආන්ඩුව බිඳ දැමීමට තුඩු දෙන්නේ නම්, මම එයට නිශ්චිතව ම විරුද්ධ වෙමි."

තමන්ගේ සෙසු තනතුරුවල වැඩවලට අවධානය සංකේන්ද්‍රනය කිරීමට අවශ්‍ය බව බව පවසමින් සමරවීර සඳුදා සිය මාධ්‍ය ඇමති තනතුරෙන් ඉල්ලා අස්විය. ඔහුගේ තීන්දුව ඒකාබද්ධ යාන්ත්‍රනයට විරෝධය පෑමක් ලෙස පුලුල්ව අර්ථ දක්වා ඇත. සමරවීර පෙර පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුවට එරෙහිව 2003 දී ජවිපෙ හා ශ්‍රීලනිප අතර සන්ධානයක් ඇති කර ගැනීමේ වැඩ කටයුතුවල ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කල පුද්ගලයෙකි.

එල්ටීටීඊය, තමන්ගේ පාර්ශ්වයෙන්, කුමාරතුංග පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය පිහිටුවීමේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යා යුතු යැයි අවධාරනය කරයි. නෝර්වේජියානු තානාපති බ්‍රැට්ස්කර් සමග පැවති සාකච්ඡාවෙන් පසුව එල්ටීටීඊයේ තමිල්චෙල්වම් මෙසේ අනතුරු ඇඟවී ය: "තමන් ඒකාබද්ධ යාන්ත්‍රනයට අත්සන් කරන බව ඔවුන් (කොලඹ) නිශ්චිතව පවසන්නේ නැති නම්, තත්වය අතිශයින්

බැරෑරුම් හා භයානක වනු ඇත.” සිය පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල වැඩෙන මහජන නොසන්සුන්තාව දුරු කර ගනු වස්, එල්ටීටීඊය මංමුලා සහගත ලෙස ආධාරවල අවශ්‍යතාවයෙන් පෙලෙයි.

කුමාරතුංග ආන්ඩුව ආධාරවලට හා සාම ක්‍රියාදාමයට බාධා කරන බවට තර්ක කරනු පිනිස ද එල්ටීටීඊය කොලඹ වර්ගෝත්තමවාදී උද්ඝෝෂනය ගසා කයි. ජාත්‍යන්තර ආධාර සමුලුවේ ප්‍රතිඵල සාකච්ඡා කරනු පිනිස එල්ටීටීඊය මැයි මස ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුලු ආධාර ඒජන්සිවලට කිලිනොච්චියට ආරාධනා කලේ ය. පසුගිය සති අන්තයේ දී එවන් රැස්වීමක් පැවැත්වේ යැයි බලාපොරොත්තු වූ නමුත් දේශපාලන අස්ථාවර භාවය හේතු ලෙස දක්වමින් ආධාර ඒජන්සි සිය සංචාරය අවලංගු කලේ ය.

එල්ටීටීඊය ගැඹුරු වන දේශපාලන ප්‍රශ්නවලට -- විශේෂයෙන් ම නැගෙනහිර පලාත තුල -- මුහුන දි සිටී. කරුනා නමින් ද ප්‍රසිද්ධ එම ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ මිලිටරි නායක වී. මුරලිදරන් එල්ටීටීඊයෙන් බිඳී ඇත. එල්ටීටීඊය නැගෙනහිර පලාතේ සිය අධිකාරිය යලි ගොඩනගා ගැනීමට තවමත් සමත්ව නැති අතර, ශ්‍රී ලංකා මිලිටරියේ කොටස්වල රහස් සහයෝගය ලබන කරුනා කන්ඩායම සමග අඛන්ඩ සන්නද්ධ ගැටුමක යෙදී සිටී. කුමාරතුංග ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවීම ප්‍රතික්ෂේප කල හොත්, එය ගැටුම උත්සන්න කිරීමටත් අස්ථාවර සටන් විරාමය බිඳවැටීමටත් සීඝ්‍රයෙන් තුඩු දිය හැකි ය.

කුමාරතුංග මොන අතට වෙට්ටු දැම්මත් ඇය මුහුන දී සිටින්නේ දේශපාලන අර්බුදයකට ය. ඇය ඒකාබද්ධ යාන්ත්‍රනයට එකඟ වුව හොත්, ජනාධිපතිනියට ජවිපෙ සහයෝගය අහිමි වනු ඇති අතර තමන්ගේ ම පක්ෂය තුල භේදයක අවදානමට ද මුහුන දෙයි. විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) වෙත හැරීමට හෝ නව මැතිවරනයක් කැඳවීමට ඇයට බල කෙරෙනු ඇත. එවන් මැතිවරනයකින් ඇගේ ශ්‍රීලනිප පරාජය වීමට ඇති ඉඩකඩ වැඩි ය. ඇය යාන්ත්‍රනයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කල හොත් නැතිනම් තව දුරටත් එය කල් දැම්ම හොත් යුද තර්ජනය ඉස්මත්තට පැමිනෙයි.

කොලඹ පාලක ප්‍රභූව තුල පවත්නා අපේක්ෂා භංගත්වය පිලිබිඹු කරමින්. ජූනි 7 දා ඩේලි මිරර් පත්‍රය, සියලු දේශපාලන පක්ෂවලින්, විශේෂයෙන් ම එජාපයෙන්, ඉල්ලා සිටියේ, “වත්මන් තත්වය තුල ඥානවන්තව හා වගකීමක් සහිතව ක්‍රියා කරන්” ලෙස යි. “සන්නද්ධ ගැටුමක හැකියාව ක්ෂිතිජයට ඔබ්බෙන් දැවැන්තව මතුව ඇති” බවට අනතුරු අඟවමින්, එම පුවත් පත මෙසේ ප්‍රකාශ කලේ යඃ “රටේ අවශ්‍යතාව ඉත සිතින් පතන සියලු ම පක්ෂ මත පැවරෙන වගකීම වන්නේ, රට ප්‍රපාතයට තල්ලු වී යාමට ඉඩ නො දී, ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවීම පිලිබඳ වත්මන් ජාතික ගැටලුවට පොදු ප්‍රවිෂ්ඨයක් වර්ධනය කර ගැනීමට ආන්ඩුවට සහාය වීම යි.”

මෙම සතියේ මුල කුමාරතුංග එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලුන්ස්ටඩ්ට දුරකතනයෙන් කතා කලා ය. ඒ දේශපාලන සහයෝගය බලාපොරොත්තුවෙන් බව පැහැදිලි ය. ඉන්දියානු උප-මහාද්වීපයේ වැඩෙන එක්සත් ජනපද අවශ්‍යතාවන්ට තර්ජනය කරන සිවිල් යුද්ධයක් කරා රට යලි ඇද වැටීම වලකාලීමේ විධි ක්‍රමයක් වසයෙන්, එල්ටීටීඊය සමග සාම ගිවිසුමක් පිලිබඳ යෝජනාවට, බුෂ් පාලනාධිකාරය, මේ දක්වා ම, පිටුබලය සපයා ඇත. ලුන්ස්ටඩ් එජාප නායක රනිල් වික්‍රමසිංහට කතා කලේ ය. ඒ එජාපය තත්වය තව දුරටත් අස්ථාවර නො කරනු ඇත යන්න පිලිබඳ යලි සහතිකයක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් බව නිසැක ය.

සියලු ම ඇඟවුම් මගින් පෙන්නුම් කෙරෙන්නේ, ලබන සතියේ දී ගැටලුව තීරනාත්මක අවස්ථාවකට පැමිනෙනු ඇති බව යි. කුමාරතුංග සිය කාඩ් අත අනන්‍යයන්ට නොපෙනෙන පරිදි තම පපුවට සමීපව තබා ගෙන සෙල්ලම් කරන අතර යෝජිත පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය පිලිබඳ විස්තර පවා එලිදරව් කොට නැත. ප්‍රවෘත්ති මාධ්‍යවලට කාන්දු කෙරී ඇති තොරතුරු මගින් පෙන්නුම් කෙරෙන්නේ මෙම ඉහල මන්ඩලයට නියෝජිතයන් තිදෙනෙකු -- ආන්ඩුවෙන්, එල්ටීටීඊයෙන් සහ මුස්ලිම් සංවිධානවලින් -- නම් කෙරෙනු ඇති බවයි. ප්‍රවෘත්ති මාධ්‍ය සමපේක්ෂනය කරන්නේ, කුමාරතුංග ගිවිසුමක් අත්සන් කිරීමේ දිනය ලෙස ජූනි 15 නියම කර ගෙන ඇති බවයි.

කුමාරතුංග ජූනි 15 දා ඒකාබද්ධ යාන්ත්‍රනය පිලිබඳ සිය සැලසුම් අත නො හැරිය හොත් සිය පක්ෂය ජූනි 16 දා ආන්ඩුවෙන් ඉවත් වන බව ජවිපෙ නායකයන් වන සෝමවංශ අමරසිංහ, ටිල්වින් සිල්වා සහ විමල් වීරවංශ බ්‍රහස්පතින්දා පැවති ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයක දී ප්‍රකාශ කලේ ය. ජවිපෙ කොලඹ මහා විරෝධතා දැක්මක් සඳහා කැඳවුම් කොට ඇත.

හෙල උරුමය ද සිය විරුද්ධත්වය උත්සන්න කර ඇත. කුමාරතුංග ඒකාබද්ධ යාන්ත්‍රනය අතහැර යුතු යැයි ඉල්ලා සිටීම පිනිස හෙල උරුමය බ්‍රහස්පතින්දා ජනාධිපති මන්දිරයට පෙලපාලියක් සංවිධානය කලේ ය. රටේ ප්‍රධාන බෞද්ධ නිකාය හතරේ මහ නායක හිමිවරුන්ගේ සහයෝගයෙන් තොරව ජනාධිපතිනිය කිසිදු ක්‍රියාමාර්ගයක් නො ගන්නා බවට සහතිකයක් ලබා ගැනීමට ද ඔවුහු උත්සාහ කලහ.

ආකාරගත වසයෙන් හෙල උරුමයේ කොටස්කරුවන් නො වූව ද, මෙම බෞද්ධ මහ නායක හිමිවරු බ්‍රහස්පතින්දා පෙර නො වූ විරූ පියවරක් ගනිමින්,

කුමාරතුංග ඒකාබද්ධ යාන්ත්‍රනය අකුලා නො ගත හොත් තමන් සංඝ ආඥාවක් නිකුත් කරන බවටත් විරෝධතා බලමුලු ගන්වන බවටත් ඇයට අනතුරු ඇඟවූහ. එවන් විරුද්ධත්වයකට ඇය දක්වන තියුනු සංවේදිතාව ප්‍රදර්ශනය කරමින්, ජනාධිපතිනිය එම භික්ෂූන් වෙත ලිපියක් ලියමින් ඔවුන්ගේ අනුමැතිය නොමැතිව කිසිදු අවසන් තීන්දුවක් නො ගන්නා බවට පොරොන්දු වූවා ය.

විශේෂයෙන් ම එලඹිය හැකි තත්වය පිලිබඳ බියකරු සලකුනක් ලෙස, හෙල උරුමයේ නායකයකු හා භික්ෂුවක වන ගලගොඩඅත්තේ ඥානසාර කල තර්ජනාත්මක ප්‍රකාශයක් බ්‍රහස්පතින්දා මාධ්‍ය මගින් වාර්තා කෙරුනි. කුමාරතුංග පැය 24ක් ඇතුලත ඇගේ සැලසුම් අතහැර දැමිය යුතු බවටත් "නැති නම් ප්‍රජාතන්ත්‍රවාදී නො වන පියවර ගැනීමට අපට බල කෙරෙනු ඇති" බවටත් ඔහු ඇයට අනතුරු ඇඟවී ය. ඥානසාර සිය තර්ජනය විස්තරාත්මකව පැහැදිලි නො කල මුත්, හෙල උරුමයට, එහි පූර්වගාමීන්ට සහ සෙසු ස්වෝත්තමවාදී කන්ඩායම්වලට ප්‍රකෝපකරනයන් හා ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳ දීර්ඝ වාර්තාවක් පවතී.

© www.wsws.org